අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education
'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/12/08/02
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2025.07. 31

**චක්‍රලේඛ අංක: 26/2025**

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පාසල්වල විදුහල්පතිවරුන්,

## <u>සුහග සිසුන් සඳහා ශිෂ්‍යත්ව වැඩසටහන</u>

සුහග ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා සිසු සිසුවියන් තෝරා ගැනීම සම්බන්ධයෙන් 2024.06.06 දිනැති අංක 22/2024 චක්‍රලේඛය සහ මීට පෙර සුහග ශිෂ්‍යත්වයට අදාළව නිකුත් කර තිබූ සියලු චක්‍රලේඛ මින් අවලංගු කරනු ලබන අතර මෙම චක්‍රලේඛයේ උපදෙස් 2025 වර්ෂයේ දී (2023 වර්ෂයට අදාළව අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටි සිසුන්) හා ඉන් ඉදිරියට සුහග ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා සිසු සිසුවියන් තෝරාගැනීමේ දී බලපවත්වනු ඇත.

අනාගත අභියෝග ජය ගැනීම සඳහා අවශ්‍ය වන විභවතාවලින් යුත් නිර්මාණශීලී තරුණ පරපුරක් බිහිකිරීම උදෙසා විවිධ ක්ෂේත්‍රවලින් සුවිශේෂ කුසලතා දක්වන පාසල් සිසුන්ගේ කුසලතා ජාතික මට්ටමෙන් ඇගයීමට ලක් කිරීම, සුහග සිසුන්ගේ සුවිශේෂ කුසලතා සංවර්ධනය කරමින් පාසල් අධ්‍යාපන ඉලක්ක සපුරා ගැනීමට අවස්ථා ලබා දීම සහ රටේ සංවර්ධනයට සුවිශේෂ දායකත්වයක් ලබා දිය හැකි වන පරිදි විවිධ ක්ෂේත්‍ර ඔස්සේ සුවිශේෂ දක්ෂතා දක්වන සිසුන්ට එම කුසලතා තවදුරටත් වැඩි දියුණු කර ගැනීමට දිරි ගැන්වීම මෙම සුහග ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ මූලික අපේක්ෂාව යි.

**01. ශිෂ්‍යත්ව සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය මූලික සුදුසුකම්**

1.1 ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම.

1.2 අදාළ වර්ෂයේ දී රජයේ පාසලක අ.පො.ස (උ.පෙළ) හැදෑරීම සඳහා අවම සුදුසුකම් සහිත ව සමත් ව, දැනට අ.පො.ස. (උ.පෙළ) හැදෑරීම ආරම්භ කරන ලද 12 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍යයකු/ ශිෂ්‍යාවක වීම

1.3 යහපත් චරිතයකින් යුක්ත ශිෂ්‍යයකු/ ශිෂ්‍යාවක වීම.

1.4 අයදුම්කරු ඉල්ලුම් කරනු ලබන ක්ෂේත්‍රයට අදාළ ක්‍රියාකාරකම්වල අඛණ්ඩ ව නිරත වී තිබීම.

**02. මෙම ශිෂ්‍යත්වය ඉල්ලුම් කිරීමේ අයදුම්පත්‍රය (ඇමුණුම 01) හා ඊට අදාළ උපදෙස් පිළිබඳව සිසුන්/ දෙමාපියන් දැනුම්වත් කළයුතු අතර එම උපදෙස් පාසලේ දැන්වීම් පුවරුවේ ද ප්‍රදර්ශනය කිරීම විදුහල්පතිවරුන්ගේ වගකීමයි.**

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk
moesecretaryoffice@gmail.com

CamScanner

## 03. අයදුම්පත් ඉදිරිපත් කිරීම

3.1 මේ සම්බන්ධ ව අදාළ අයදුම්පත්‍රයේ ආකෘතියට (ඇමුණුම 01) අනුව සිසුන් විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත් පිටපත් දෙකකින් යුක්ත ව, අදාළ සහතිකවල පිටපත් ද සමඟ දැනට අ.පො.ස. (උ.පෙළ) ඉගෙනුම ලබන පාසලේ විදුහල්පති වෙත යොමු කළ යුතු ය. අ.පො.ස. (උ.පෙළ) හැදෑරීම සඳහා වෙනත් පාසලකට ඇතුළත් වී සිටින සිසුන් තමා, අ.පො.ස (සා.පෙළ) හැදෑරූ පාසලේ විදුහල්පති නිර්දේශය ද සහිත ව අ.පො.ස. (උ.පෙළ) හදාරනු ලබන පාසලේ විදුහල්පති වෙත අයදුම්පත් බාර දිය යුතු ය.

3.2 මෙම ශිෂ්‍යත්ව ප්‍රදානය පහත සඳහන් පරිදි විශේෂ කාණ්ඩ 5ක් යටතේ සිදු කෙරේ.

I. කාණ්ඩ අංක 01- නව නිපැයුම් සහ තාක්ෂණික නිර්මාණ සඳහා ලබා ගත් ජයග්‍රහණ
II. කාණ්ඩ අංක 02 - සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ
III. කාණ්ඩ අංක 03 - ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ
IV. කාණ්ඩ අංක 04 - විද්‍යා, ගණිත, භාෂා, තොරතුරු තාක්ෂණ ඇතුළු අනෙකුත් විෂයයන් සඳහා ලබා ගත් ජයග්‍රහණ
V. කාණ්ඩ අංක 05 - විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ

කාණ්ඩ කිහිපයකින් ඉල්ලුම් කරන්නේ නම් එක් එක් කාණ්ඩය යටතේ වෙන් වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

3.3 ඉහත 1.1 සිට 1.4 දක්වා ඇති කරුණු අනුව මූලික සුදුසුකම් සපුරන ශිෂ්‍යයකුට/ශිෂ්‍යාවකට තම සුවිශේෂ දක්ෂතා මත 3.2 හි සඳහන් ඕනෑ ම කාණ්ඩයක් යටතේ ඉල්ලුම්පත් යොමු කළ හැකි ය.

## 04. තෝරා ගැනීමේ ක්‍රමවේදය

මෙම චක්‍රලේඛයේ 06 කොටසේ සඳහන් ලකුණු පටිපාටියට අනුකූලව පහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කරමින්, එක් එක් මට්ටමේ දී අයදුම්පත් හා සහතික මැනවින් පරීක්ෂා කර අයදුම්පතෙහි පිටපත් දෙකෙහි ම අදාළ තීරුවේ ලකුණු සටහන් කළ යුතු ය.

නියමිත දිනට පසු ව පාසලට ලැබෙන අයදුම්පත් හා අදාළ අයදුම්පතෙහි සඳහන් සුදුසුකම් සනාථ කිරීමට අවශ්‍ය සහතිකවල පිටපත් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කළ යුතු ය.

### 4.1 පාසල් මට්ටම

I. පාසලට ලැබෙන අයදුම්පත් සියල්ලෙහිම මූලික තොරතුරු ලේඛනගත කර පාසලේ පවත්වා ගත යුතුය (සී.ආර් පොතක හෝ පරිගණකගත කර දෘඩ පිටපත ගොනු කර තැබිය යුතු ය)

II. විදුහල්පතිගේ සභාපතිත්වයෙන් හා ජ්‍යෙෂ්ඨ ගුරුවරු දෙදෙනෙකුගේ සාමාජිකත්වයෙන් යුත් (තිදෙනකුගෙන් සමන්විත) පාසල් තේරීම් කමිටුවක් විසින් අයදුම්පත් පරීක්ෂා කර ප්‍රදානය කරන ලකුණු, අයදුම්පතෙහි ලකුණු තීරුව 01හි සඳහන් කළ යුතු ය.

III. පාසලට ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව 150කට වඩා සැලකිය යුතු සංඛ්‍යාවක් ඉක්ම වූ අවස්ථාවකදී පමණක් අයදුම්පත් පරීක්ෂා කිරීමේ කඩිනම් බව, නිරවද්‍ය බව හා පහසුව සලකා සුදුසු පරිදි නියෝජ්‍ය/ සහකාර විදුහල්පතිවරයෙකු හෝ අංශ ප්‍රධානි/ ශ්‍රේණි ප්‍රධානි ගුරුවරයෙකුගේ සභාපතිත්වයෙන් යුතු පාසල් තේරීම් කමිටු එකකට වඩා පත්කර ගත හැකිය. එසේ වුව ද කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත තෝරා ගත් සිසුන්ගේ නාම ලේඛන යොමු කිරීමේ දී විදුහල්පති විසින් අදාළ කමිටු මඟින් තෝරා ගත් ශිෂ්‍ය නාම ලේඛනවල නිරවද්‍ය බව සහතික කළ යුතු ය.

CS CamScanner

IV. ඒ ඒ කාණ්ඩය යටතේ එක් එක් ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ සුදුසුකම් සනාථ කර ගැනීමෙන් අනතුරුව සහතිකවල මුල් පිටපත් පරීක්ෂාකර චක්‍රලේඛානුකූලව සුදුසුකම් සපුරා ඇති සියළුම අයදුම්කරුවන්ගේ නාම ලේඛන එක් එක් කාණ්ඩය යටතේ වෙන් වෙන් වශයෙන් ඇමුණුම 02(A) ආකෘතියට අනුකූල ව මුළු ලකුණු අවරෝහණ අනුපිළිවෙලට සකස් කළ යුතු ය. එම ආකෘතිය (දෘඩ හා මෘදු පිටපත්) සමඟ අයදුම්කරුවන්ගේ අයදුම්පත් හා සහතිකවල පිටපත් අනුපිළිවෙලින් සකස් කර විදුහල්පති විසින් සහතික කර එක් අයදුම්පතක් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු ය. එහි අනෙක් පිටපත පාසලේ සුරක්ෂිත ව තබා ගත යුතු ය.

## 4.2 කලාප මට්ටම

I. කලාප මට්ටමේදී සුහඟ ශිෂ්‍යත්ව වැඩසටහන සම්බන්ධීකරණය සඳහා මාණ්ඩලික නිලධාරියෙකු පත්කිරීමට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කටයුතු කළ යුතුය.

II. මෙම චක්‍රලේඛයේ ඇමුණුම 02 (A) ආකෘතිය සමඟ ඒ ඒ පාසලෙන් ලැබෙන අයදුම්පත් හා අදාළ සහතික/ ලේඛන ද ඉහත සඳහන් සම්බන්ධීකරණ නිලධාරියාගේ සම්බන්ධීකරණයෙන් පහත පරිදි පරීක්ෂා කළ යුතු ය.

III. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අධීක්ෂණයෙන්, ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියකුගේ සභාපතිත්වයෙන් හා තවත් මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකුගේ සාමාජිකත්වයෙන් යුත් (තිදෙනකුගෙන් සමන්විත) කලාප තේරීම් කමිටුව පිහිටුවිය යුතුය. චක්‍රලේඛය අනුව ප්‍රදානය කරන ලකුණු අයදුම්පතෙහි ලකුණු තීරුව 02හි සඳහන් කළ යුතු ය.

IV. කලාප අධ්‍යාපන කාර්යාලයට ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව 150කට වඩා සැලකිය යුතු සංඛ්‍යාවක් ඉක්මවූ අවස්ථාවකදී පමණක් ශිෂ්‍යත්වලාභීන් තේරීමේ කඩිනම් බව, නිරවද්‍ය බව හා පහසුව සලකා සුදුසු පරිදි කලාප තේරීම් කමිටු එකකට වඩා පත්කර ගත හැකි ය. එසේ වුව ද පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත තෝරා ගත් සිසුන්ගේ නාම ලේඛන යොමු කිරීමේ දී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අදාළ කමිටු මඟින් තෝරා ගත් ශිෂ්‍ය නාම ලේඛනවල නිරවද්‍ය බව සහතික කළ යුතු ය.

V. මෙහි දී සහතිකපත් පරීක්ෂා කිරීමෙන් අනතුරුව කලාප තේරීම් කමිටුව විසින් ලබා දෙනු ලබන ලකුණු හා පාසල් තේරීම් කමිටුව විසින් ලබා දී ඇති ලකුණුවල යම් වෙනසක් ඇත්නම් කලාප තේරීම් කමිටුව මඟින් ලබා දෙන ලකුණු නිරවද්‍ය ලෙස පිළිගනු ලැබේ.

VI. එක් එක් කාණ්ඩය යටතේ ලකුණු 10 හෝ ඊට වැඩි ලකුණු ලබා ගන්නා ලද තෝරා ගත් අයදුම්කරුවන්ගේ නාම ලේඛන වෙන් වෙන් වශයෙන් ඇමුණුම 02 (B) ආකෘතියට අනුකූල ව මුළු ලකුණු අවරෝහණ අනුපිළිවෙළට සකස් කළ යුතු ය. එම ආකෘතිය (දෘඩ හා මෘදු පිටපත්) සමඟ එහි ඇතුළත් අයදුම්කරුවන්ගේ අයදුම්පත් හා සහතිකවල පිටපත් අනුපිළිවෙළින් සකස් කර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු ය.

ඊට අමතරව ලකුණු 10 ට අඩු ලකුණු ලබා ගන්නා ලද අයදුම්කරුවන්ගේ නාමලේඛනය ද අමුණුම 02(B) ආකෘතියට අනුව මුළු ලකුණු අවරෝහණ අනුපිළිවෙලට වෙනම සකස්කර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

VII. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් තෝරාගෙන කලාප අධ්‍යාපන කාර්යාලය වෙත යොමුකරන ශිෂ්‍යත්වලාභීන් සුහඟ ශිෂ්‍යත්වය ලැබීමට සුදුසුකම් ලබන අතර පාසල්වල විදුහල්පතිවරු මඟින් සිසුන් දැනුම්වත් කර ඔවුන්ගේ බැංකු ගිණුම්වල (ලංකා බැංකු හෝ මහජන බැංකු) තොරතුරු බැංකු පොතෙහි සහතික කරන ලද පිටපත් සමඟ ඇමුණුම 03 මඟින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය.

VIII. සුදුසුකම් ලැබ තෝරා ගත් පාසල්වල සුහඟ ශිෂ්‍යත්වධාරීන් සඳහා ශිෂ්‍යත්ව වාරික මුදල් කලාප අධ්‍යාපන කාර්යාලය විසින් ශිෂ්‍යත්වධාරීන්ගේ බැංකු ගිණුම්වලට සෘජුවම ප්‍රේෂණය කළ යුතුය.

CamScanner

### 4.3 පළාත් මට්ටම

I. පළාත් මට්ටමේදී සුභග ශිෂ්‍යත්ව වැඩසටහන සම්බන්ධීකරණය සඳහා මාණ්ඩලික නිලධාරියෙකු පත් කිරීමට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කටයුතු කළ යුතුය.

II. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අධීක්ෂණයෙන් ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියකුගේ සභාපතිත්වයෙන් හා තවත් මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකුගේ සාමාජිකත්වයෙන් යුත් (තිදෙනකුගෙන් සමන්විත) සමාන්තර පළාත් තේරීම් කමිටු පිහිටුවා අයදුම්පත් පරීක්ෂා කර ප්‍රදානය කරන ලකුණු අයදුම්පතෙහි ලකුණු තීරුව 03හි සඳහන් කළ යුතු ය.

III. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව 150කට වඩා සැලකිය යුතු සංඛ්‍යාවක් ඉක්ම වූ අවස්ථාවකදී පමණක් අයදුම්පත් පරීක්ෂා කිරීමේ කඩිනම් බව, නිරවද්‍ය බව හා පහසුව සලකා සුදුසු පරිදි කමිටු එකකට වඩා පත්කර ගත හැකිය. එසේ වුව ද අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත තෝරා ගත් සිසුන්ගේ නාම ලේඛන යොමු කිරීමේ දී පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අදාළ කමිටු මඟින් තෝරා ගත් ශිෂ්‍ය නාම ලේඛන නිරවද්‍ය බවට සහතික කළ යුතු ය.

IV. ඒ ඒ පළාත් අනුව චක්‍රලේඛානුකූලව එක් කාණ්ඩයකින් ඉහළ ම ලකුණු ලබා ගත් සිසුන් තෝරා ගත යුතු අතර කාණ්ඩ පහෙන්ම සම සමව සිසුන් තෝරා ගැනීමට කටයුතු කළ යුතු ය. යම් කාණ්ඩයකින් නියමිත සංඛ්‍යාව සපුරා නොමැති නම් පමණක් අනෙකුත් කාණ්ඩ යටතේ එම සංඛ්‍යාව සමානුපාතික ව බෙදෙන පරිදි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව තෝරා ගත යුතු ය.

වගු අංක 01 : එක් එක් පළාත සඳහා වෙන් කර ඇති ශිෂ්‍යත්ව සංඛ්‍යාව

| පළාත | ලබා දෙනු ලබන මුළු ශිෂ්‍යත්ව සංඛ්‍යාව |
|---|---|
| බස්නාහිර | 200 |
| මධ්‍යම | 135 |
| දකුණ | 125 |
| වයඹ | 125 |
| සබරගමුව | 100 |
| නැගෙනහිර | 95 |
| උතුරු මැද | 75 |
| ඌව | 75 |
| උතුර | 70 |

V. ඒ අනුව, පළාත් මට්ටමින් තෝරා ගත් ශිෂ්‍යත්ව ලාභීන්ගේ නාම ලේඛන ඇමුණුම 04 ආකෘතියට අනුකූල ව සකස් කළ යුතු ය. එම ආකෘතියෙහි දෘඩ හා මෘදු පිටපත් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කර අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය පාසල් කටයුතු ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කර අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතුය. එම අනුමැතිය ලද පසු අදාළ ප්‍රතිපාදන අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඒ ඒ පළාත්වලට ලබා දෙනු ඇත.

VI. ශිෂ්‍යත්වධාරීන්ගේ නාම ලේඛනවලට අනුමැතිය ලද පසු ඒ පිළිබඳව අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ දැනුම්වත් කළ යුතු අතර පළාතේ එක් එක් කලාපයෙන් තේරී ඇති ශිෂ්‍යත්වධාරීන් සඳහා හිමි ශිෂ්‍යත්ව වාරික මුදල් ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් කලාප අධ්‍යාපන කාර්යාල වෙත ලබා දිය යුතුය.

CamScanner

### 4.4 ජාතික මට්ටම

I. සෑම වර්ෂයකදී ම අයදුම්පත් කැඳවීමට අදාළ උපදෙස් ලිපිය අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු වෙත නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

II. පළාත් මට්ටමින් යොමුකරන ශිෂ්‍යත්වධාරීන් සංඛ්‍යාවට ශිෂ්‍යත්ව වාරික ගෙවීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට පැවරිය යුතුය.

**4.5 ශිෂ්‍යයකු/ ශිෂ්‍යාවක කාණ්ඩ කිහිපයකින් ශිෂ්‍යත්වය සඳහා ඉල්ලුම් කළ ද එක් කාණ්ඩයකින් පමණක් මෙම ශිෂ්‍යත්වය ලැබීම සඳහා හිමිකම් ලබනු ඇත.**

## 05. තෝරා ගැනීම සඳහා උපයෝගී කර ගන්නා කාණ්ඩ, නිර්ණායක හා අදාළ ලකුණු පටිපාටිය

2.4 හි සඳහන් පරිදි කාණ්ඩ 05 ක් පදනම් කර ගෙන විශේෂ නිර්ණායක හා පොදු නිර්ණායක යටතේ ලකුණු ලබා දීම සිදු කරයි.

මෙහි දී, ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක අදාළ වර්ෂයට ආසන්න අනුයාත වර්ෂ 4ක් තුළ දී ලබා ගත් ජයග්‍රහණ පමණක් සලකා බැලිය යුතු අතර විශේෂ නිර්ණායක යටතේ ලකුණු ලබා ඇති සිසුන් පමණක් ශිෂ්‍යත්වය සඳහා සුදුසුකම් ලබයි.

**I. විශේෂ නිර්ණායක - උපරිම ලකුණු 60**

මේ යටතේ ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක පහත සඳහන් ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයක් සඳහා පමණක් දක්වන ලද දක්ෂතා ඇගයීමට ලක් කළ යුතු ය.

i. නව නිපැයුම් හා තාක්ෂණික නිර්මාණ සඳහා ලබා ගත් ජයග්‍රහණ
ii. සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ
iii. ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ
iv. විද්‍යා, ගණිත, භාෂා, තොරතුරු තාක්ෂණ ඇතුළු අනෙකුත් විෂයයන් සඳහා ලබා ගත් ජයග්‍රහණ
v. විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ

**II. පොදු නිර්ණායක I - උපරිම ලකුණු 20**

ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක තමන් අයදුම් කරන කාණ්ඩය හැර අනෙක් කාණ්ඩයක් යටතේ දක්වා ඇති දක්ෂතා අදාළ පරිදි වගු අංක 2හි පොදු නිර්ණායක I යටතේ සඳහන් නිර්ණායක මඟින් ඇගයීමට ලක් කළ යුතු ය.

මෙහි දී, අයදුම් කරනු ලබන කාණ්ඩයට අදාළ විශේෂ නිර්ණායකය සඳහා ලකුණු ලබා නොදිය යුතු ය.

**III. පොදු නිර්ණායක II - උපරිම ලකුණු 20**

අනෙකුත් දක්ෂතා සඳහා වගු අංක 02 හි පොදු නිර්ණායක II යටතේ සඳහන් නිර්ණායක මඟින් ඇගයීමට ලක් කළ යුතුය.

**IV.** මෙම චක්‍රලේඛයේ 6.1 සිට 6.10 සඳහන් සවිස්තරාත්මක ලකුණු ලබා දීමේ ක්‍රමය අනුගමනය කර ඉහත I, II,III කොටස් සඳහා ලකුණු ලබා දීම සිදු කළ යුතුය.

CamScanner

වගු අංක 02: නිර්ණායක සඳහා ලබා දිය යුතු ලකුණු

| නිර්ණායක | කාණ්ඩ අංක 01 | කාණ්ඩ අංක 02 | කාණ්ඩ අංක 03 | කාණ්ඩ අංක 04 | කාණ්ඩ අංක 05 |
|---|---|---|---|---|---|
| විශේෂ නිර්ණායක (උපරිම ලකුණු 60) | නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 60) | සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 60) | ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 60) | විද්‍යා, ගණිත, භාෂා, තොරතුරු තාක්ෂණ ඇතුලු අනෙකුත් විෂයන් සඳහා ලබාගත් ජයග්‍රහණ (ලකුණු 60) | විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 60) |
| පොදු නිර්ණායක I (උපරිම ලකුණු 20) | සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 05) | නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 05) | නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 05) | නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 05) | නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 05) |
| | ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 05) | ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 05) | සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 05) | සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 05) | සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 05) |
| | විද්‍යා, ගණිත, භාෂා, තොරතුරු තාක්ෂණ ඇතුළු අනෙකුත් විෂයන් සඳහා ලබාගත් ජයග්‍රහණ (ලකුණු 05) | විද්‍යා, ගණිත, භාෂා, තොරතුරු තාක්ෂණ ඇතුළු අනෙකුත් විෂයන් සඳහා ලබාගත් ජයග්‍රහණ (ලකුණු 05) | විද්‍යා, ගණිත, භාෂා, තොරතුරු තාක්ෂණ ඇතුළු අනෙකුත් විෂයන් සඳහා ලබාගත් ජයග්‍රහණ (ලකුණු 05) | ක්‍රීඩා සඳහා ලබාගත් ජයග්‍රහණ (ලකුණු 05) | ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 05) |
| | විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ලබාගත් ජයග්‍රහණ (ලකුණු 05) | විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ලබාගත් ජයග්‍රහණ (ලකුණු 05) | විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ලබාගත් ජයග්‍රහණ (ලකුණු 05) | විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ලබාගත් ජයග්‍රහණ (ලකුණු 05) | විද්‍යා, ගණිත, භාෂා, තොරතුරු තාක්ෂණ ඇතුලු අනෙකුත් විෂයන් සඳහා ලබාගත් ජයග්‍රහණ (ලකුණු 05) |
| පොදු නිර්ණායක II (උපරිම ලකුණු 20) | අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල මත (ලකුණු 06) | අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල මත (ලකුණු 06) | අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල මත (ලකුණු 06) | අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල මත (ලකුණු 06) | අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල මත (ලකුණු 06) |

CamScanner

| | | | | | |
|---|---|---|---|---|---|
| | පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළව ක්‍රියාකාරකම් සහ ජයග්‍රහණ (ලකුණු 08) | පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළව ක්‍රියාකාරකම් සහ ජයග්‍රහණ(ලකුණු 08) | පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළව ක්‍රියාකාරකම් සහ ජයග්‍රහණ(ලකුණු 08) | පරයේෂණ ක්ෂේත්‍රයට අදාළව ක්‍රියාකාරකම් සහ ජයග්‍රහණ(ලකුණු 08) | පරයේෂණ ක්ෂේත්‍රයට අදාළව ක්‍රියාකාරකම් සහ ජයග්‍රහණ(ලකුණු 08) |
| | පාසල් නායකත්වය දැරීම (ලකුණු 03) | පාසල් නායකත්වය දැරීම (ලකුණු 03) | පාසල් නායකත්වය දැරීම (ලකුණු 03) | පාසල් නායකත්වය දැරීම (ලකුණු 03) | පාසල් නායකත්වය දැරීම (ලකුණු 03) |
| | රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පෞද්ගලික ආයතන රාජ්‍ය හා පෞද්ගලික විශ්ව විද්‍යාල, යුනෙස්කො, යුනිසෙෆ් ආදී අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාශයේ විධිමත් අනුමැතිය ලද තරග/ වැඩසටහන් (උපරිම ලකුණු 03) | රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පෞද්ගලික ආයතන රාජ්‍ය හා පෞද්ගලික විශ්ව විද්‍යාල, යුනෙස්කො, යුනිසෙෆ් ආදී අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාශයේ විධිමත් අනුමැතිය ලද තරග/ වැඩසටහන් (උපරිම ලකුණු 03) | රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පෞද්ගලික ආයතන රාජ්‍ය හා පෞද්ගලික විශ්ව විද්‍යාල, යුනෙස්කො, යුනිසෙෆ් ආදී අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාශයේ විධිමත් අනුමැතිය ලද තරග/ වැඩසටහන් (උපරිම ලකුණු 03) | රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පෞද්ගලික ආයතන රාජ්‍ය හා පෞද්ගලික විශ්ව විද්‍යාල, යුනෙස්කො, යුනිසෙෆ් ආදී අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාශයේ විධිමත් අනුමැතිය ලද තරග/ වැඩසටහන් (උපරිම ලකුණු 03) | රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පෞද්ගලික ආයතන රාජ්‍ය හා පෞද්ගලික විශ්ව විද්‍යාල, යුනෙස්කො, යුනිසෙෆ් ආදී අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාශයේ විධිමත් අනුමැතිය ලද තරග/ වැඩසටහන් (උපරිම ලකුණු 03) |

## 06. ලකුණු ලබා දීම සවිස්තරාත්මකව

### 6.1 කාණ්ඩ අංක 01 - නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ

නව නිපැයුම් ආශ්‍රිතව දක්වා ඇති කුසලතා සඳහා අදාළ වර්ෂයට ආසන්න අනුයාත වසර 4ක් තුළ දී පහත වගු අංක 03 පරිදි ලකුණු ප්‍රදානය කළ යුතු ය. මෙහි දී උපරිම ලකුණු ලද අවස්ථා තුනක් පමණක් සලකා බැලිය යුතු ය.

වගු අංක 03 : නව නිපැයුම් සඳහා ලකුණු ලබා දීම

| අනු අංකය | තරගය | මට්ටම | ස්ථානය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | අන්තර්ජාතික තරගවලින් ප්‍රථම ස්ථාන | | | 20 |
| 02 | අන්තර්ජාතික තරගවලින් දෙවන හෝ තෙවන ස්ථාන (2, 3) | | | 18 |
| 03 | පේටන්ට් බලපත්‍ර ලබා තිබීම | | | 16 |
| 04 | නව නිපැයුම් (සමස්ත ලංකා පාසල් රොබෝ තාක්ෂණ හා නව නිර්මාණ තරගාවලිය හා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් ක්‍රියාත්මක කරන තරගාවලියන්හි ඕනෑම තේමාවක ඕනෑම තරග අංශයක් සඳහා පමණි.) | ජාතික මට්ටම | 1 | 14 |
| 05 | | | 2 | 13 |
| 06 | | | 3 | 12 |
| 07 | | | කුසලතා | 11 |
| 09 | | පළාත් මට්ටම | 1 | 10 |
| 10 | | | 2 | 08 |
| 11 | | | 3 | 06 |
| 12 | | කලාප මට්ටම | 1 | 04 |

උපරිම ලකුණු 60

CamScanner

## 6.2 කාණ්ඩ අංක 02 - සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ

සමස්ත ලංකා සෞන්දර්ය තරගවලින් අදාළ වර්ෂයට ආසන්න අනුයාත වසර 4ක් තුළ දී වගු අංක 04හි සඳහන් පරිදි උපරිම වශයෙන් කේවල හා /හෝ කණ්ඩායම් තරග සඳහා උපරිම ලකුණු ලද අවස්ථා තුනක් පමණක් සලකා බැලිය යුතු ය.

වගු අංක 04: සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලකුණු ලබා දීම

| අනු අංකය | ඒකල/ සමූහ | මට්ටම | ස්ථානය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | ඒකල | අන්තර්ජාතික | 1 | 20 |
| 02 | | | 2 | 19 |
| 03 | | | 3 | 18 |
| 04 | | ජාතික | 1 | 17 |
| 05 | | | 2 | 15 |
| 06 | | | 3 | 13 |
| 07 | | පළාත් | 1 | 12 |
| 08 | | | 2 | 10 |
| 09 | | | 3 | 08 |
| | | කලාප | 1 | 06 |
| 10 | සමූහ | අන්තර්ජාතික | 1 | 17 |
| 11 | | | 2 | 16 |
| 12 | | | 3 | 15 |
| 13 | | ජාතික | 1 | 13 |
| 14 | | | 2 | 12 |
| 15 | | | 3 | 10 |
| 16 | | පළාත් | 1 | 08 |
| 17 | | | 2 | 07 |
| 18 | | | 3 | 06 |
| 19 | | කලාප | 1 | 04 |

උපරිම ලකුණු 60

## 6.3 කාණ්ඩ අංක 03 -ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ

සමස්ත ලංකා ක්‍රීඩා තරගවලින් අදාළ වර්ෂයට ආසන්න අනුයාත වසර 4ක් තුළ දී වගු අංක 05හි සඳහන් පරිදි උපරිම වශයෙන් කේවල හා /හෝ කණ්ඩායම් තරග සඳහා උපරිම ලකුණු ලද අවස්ථා තුනක් පමණක් සලකා බැලිය යුතු ය. එක් ක්‍රීඩාවකට හෝ එක් ඉසව්වකට උපරිම දක්ෂතාවන්ට පමණක් ලකුණු ලබා දේ.

වගු අංක 05: ක්‍රීඩා ජයග්‍රහණ සඳහා ලකුණු ලබා දීම

| අනු අංකය | ඒකල/ සමූහ | මට්ටම | ස්ථානය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | ඒකල | අන්තර්ජාතික | 1 | 20 |
| 02 | | | 2 | 19 |
| 03 | | | 3 | 18 |
| 04 | | ජාතික | 1 | 17 |
| 05 | | | 2 | 15 |
| 06 | | | 3 | 13 |
| 07 | | පළාත් | 1 | 12 |
| 08 | | | 2 | 10 |
| 09 | | | 3 | 08 |
| | | කලාප | 1 | 06 |

CamScanner

| | | | | |
|---|---|---|---|---|
| 11 | සමූහ | අන්තර්ජාතික | 2 | 16 |
| 12 | | | 3 | 15 |
| 13 | | ජාතික | 1 | 13 |
| 14 | | | 2 | 12 |
| 15 | | | 3 | 10 |
| 16 | | පළාත් | 1 | 08 |
| 17 | | | 2 | 07 |
| 18 | | | 3 | 06 |
| 19 | | කලාප | 1 | 04 |

උපරිම ලකුණු 60

### 6.4 කාණ්ඩ අංක 04 - විද්‍යා/ගණිත /තොරතුරු තාක්ෂණ /භාෂා සඳහා ලබා ගත් ජයග්‍රහණ

පහත සඳහන් කර ඇති අංශ යටතේ අදාළ වර්ෂයට ආසන්න අනුයාත වසර 4ක් තුළ දී වගු අංක 06හි සඳහන් පරිදි උපරිම ලකුණු ලද අවස්ථා තුනක් පමණක් සලකා බැලිය යුතු ය. එක් තරගයකට අදාළව උපරිම දක්ෂතාවන්ට පමණක් ලකුණු ලබා දේ.

වගු අංක 06: විෂය ජයග්‍රහණ සඳහා ලකුණු ලබා දීම

| අනු අංකය | ඒකල/ සමූහ | මට්ටම | ස්ථානය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | ඒකල | අන්තර්ජාතික | 1 | 20 |
| 02 | | | 2 | 19 |
| 03 | | | 3 | 18 |
| 04 | | ජාතික | 1 | 17 |
| 05 | | | 2 | 15 |
| 06 | | | 3 | 13 |
| 07 | | පළාත් | 1 | 12 |
| 08 | | | 2 | 10 |
| 09 | | | 3 | 08 |
| | | කලාප | 1 | 06 |
| 10 | සමූහ | අන්තර්ජාතික | 1 | 17 |
| 11 | | | 2 | 16 |
| 12 | | | 3 | 15 |
| 13 | | ජාතික | 1 | 13 |
| 14 | | | 2 | 12 |
| 15 | | | 3 | 10 |
| 16 | | පළාත් | 1 | 08 |
| 17 | | | 2 | 07 |
| 18 | | | 3 | 06 |
| 19 | | කලාප | 1 | 04 |

උපරිම ලකුණු 60

CamScanner

## 6.5 කාණ්ඩ අංක 05 - විෂයය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ

පහත සඳහන් කර ඇති අංශ යටතේ අදාළ වර්ෂයට ආසන්න අනුයාත වසර 4ක් තුළ දී වගු අංක 07හි සඳහන් පරිදි උපරිම ලකුණු ලද අවස්ථා තුනක් පමණක් සලකා බැලිය යුතු ය. එක් අංශයකට අදාළව උපරිම දක්ෂතාවන්ට පමණක් ලකුණු ලබා දේ.

**වගු අංක 07: විෂයය සමගාමී ජයග්‍රහණ සඳහා ලකුණු ලබා දීම**

| ක්‍රියාකාරකම | ලබා ඇති පදක්කම | ලකුණු |
|---|---|---|
| බාලදක්ෂ/ බාලදක්ෂිකා | ජනාධිපති බාලදක්ෂ/ බාලදක්ෂිකා පදක්කම | 20 |
| | අග්‍රාමාත්‍ය ප්‍රදානය/ පළමු පෙළ පදක්කම | 15 |
| | අන්තර් ජාතික කඳවුරු/වැඩසටහන් සහභාගීත්වය | 10 |
| | බාලදක්ෂ/බාලදක්ෂිකා/රේන්ජර් දක්ෂිකා සමාජිකත්වය | 05 |
| ශිෂ්‍යභට | බලලත් නිලධාරි 1 (රෙජිමේන්තු සැරයන් මේජර්) (RSM) | 20 |
| | බලලත් නිලධාරි 2 (කණ්ඩායම් භාර සැරයන් මේජර්) (CSM) | 15 |
| | බලලත් නිලධාරි 2 (රෙජිමේන්තු උපකරණ භාර සැරයන් මේජර්) (RQSM) | 10 |
| | බලලත් නිලධාරි 2 ( කණ්ඩායම් උපකරණ භාර නිලධාරි) (CQSM) | 7 |
| | ලාන්ස් කෝප්‍රල්/ පෙරදිග / අපරදිග තූර්ය වාදක කණ්ඩය / ගර්ටන් ලූස් / ද සොයිසා / ජ්‍යාන්තන්තර නියෝජන | 5 |
| පරිසර නියමු | ජනාධිපති පදක්කම (විශිෂ්ඨ සම්මාන) | 20 |
| | ජනාධිපති පදක්කම (සම්මාන) | 16 |
| | ජනාධිපති පදක්කම (සාමාන්‍ය) | 13 |
| | ස්වර්ණ වර්ණ පදක්කම | 10 |
| | රජත පදක්කම | 5 |
| ශිෂ්‍ය පාර්ලිමේන්තුව | ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තුව අගමැති/කථානායක | 20 |
| | ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තුව අමාත්‍ය | 10 |
| | ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තුව මන්ත්‍රී | 8 |
| | පළාත් ශිෂ්‍ය පාර්ලිමේන්තුව අගමැති/කථානායක | 7 |
| | පළාත් ශිෂ්‍ය පාර්ලිමේන්තුව අමාත්‍ය | 05 |
| | පළාත් ශිෂ්‍ය පාර්ලිමේන්තුව මන්ත්‍රී | 02 |

**උපරිම ලකුණු 60**

## 6.6 පොදු නිර්ණායක - I කොටස

**වගු අංක 08: ඉල්ලුම් කරන කාණ්ඩයට අමතරව අනෙක් කාණ්ඩ සඳහා ලකුණු ලබා දීම (විෂය සමගාමී ක්‍රියාකාරකම් හැර)**

| ලබා ඇති ජයග්‍රහණ | ලකුණු |
|---|---|
| අන්තර්ජාතික මට්ටම | 05 |
| ජාතික මට්ටම | 04 |
| පළාත් මට්ටම | 03 |

**උපරිම ලකුණු 05**

CamScanner

වගු අංක 09: විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා

| ලබා ඇති පදක්කම | ලකුණු |
|---|---|
| ජනාධිපති බාලදක්ෂ/ බාලදක්ෂිකා පදක්කම/ බලලත් නිලධාරී 1/ පරිසර නියමු ජනාධිපති පදක්කම/ ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තුව අගමැති/කථානායක/ අමාත්‍ය | 05 |
| අග්‍රාමාත්‍ය ප්‍රදානය/ පළමු පෙළ පදක්කම/ අන්තර් ජාතික කඳවුරු/වැඩසටහන් සහභාගීත්වය/ බලලත් නිලධාරී 2/ මාණ්ඩලික සැරයන්/සැරයන්/ ස්වර්ණ වර්ණ පදක්කම/ රජත පදක්කම/ ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තුව මන්ත්‍රී/ පළාත් ශිෂ්‍ය පාර්ලිමේන්තුව අගමැති/කථානායක/ අමාත්‍ය | 04 |
| ලාන්ස් කෝප්‍රල්/ පෙරදිග / අපරදිග තූර්ය වාදක කණ්ඩය / ගර්ටන් ලූස් / ද සොයිසා / ජාත්‍යන්තර නියෝජන/ හරිත පදක්කම/ පළාත් ශිෂ්‍ය පාර්ලිමේන්තුව මන්ත්‍රී/ කථානායක/ කලාප ශිෂ්‍ය පාර්ලිමේන්තුව/ අගමැති /කථානායක | 03 |
| බාලදක්ෂ/බාලදක්ෂිකා/රේන්ජර් දක්ෂිකා සමාජිකත්වය/ කලාප ශිෂ්‍ය පාර්ලිමේන්තුව අමාත්‍ය/ මන්ත්‍රී | 02 |

**උපරිම ලකුණු 05**

## 6.7 පොදු නිර්ණායක II කොටස

**අ.පො.ස.(උ.පෙළ)ට ඇතුළත් වීමට අදාළ අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල**

**වගු අංක 10: අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල සඳහා ලකුණු ලබා දීම.**

| | |
|---|---|
| විෂයන් නවයටම A සාමාර්ථ සහිතව සා.පෙළ සමත්වීම | ලකුණු 6 |
| ඕනෑ ම විෂයන් 6ත් -8ත් අතර සංඛ්‍යාවක් සඳහා A සාමාර්ථ සහිතව සා.පෙළ සමත්වීම | ලකුණු 5 |
| ඕනෑ ම විෂයන් 4ත් -5ත් අතර සංඛ්‍යාවක් සඳහා A සාමාර්ථ සහිතව සා.පෙළ සමත්වීම | ලකුණු 4 |
| ඕනෑ ම විෂයන් 1ත් -3ත් අතර සංඛ්‍යාවක් සඳහා A සාමාර්ථ සහිතව සා.පෙළ සමත්වීම | ලකුණු 3 |
| සම්මාන සාමාර්ථ 3 ක් සහිත ව සා.පෙළ සමත්වීම | ලකුණු 2 |

**උපරිම ලකුණු 06**

## 6.8 පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළව ක්‍රියාකාරකම් සහ ජයග්‍රහණ

**වගු අංක 11: පර්යේෂණ සඳහා ලකුණු ලබා දීම**

| පර්යේෂණ අවස්ථා | ලකුණු |
|---|---|
| අන්තර්ජාතික මට්ටමින් පර්යේෂණ ඉදිරිපත් කිරීම | 08 |
| ජාතික මට්ටමින්පර්යේෂණක් ප්‍රසිද්ධ කිරීම, පිළිගත් ආයතනයකට/ විශ්ව විද්‍යාලයකට හෝ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබීම | 07 |
| පර්යේෂණක් ලිඛිත හා මුද්‍රිත මාධ්‍යය මගින් ප්‍රසිද්ධ කිරීම. | 06 |
| ජාතික මට්ටමේ තරඟාවලියක පර්යේෂණ ජයග්‍රහණ | 05 |
| ජාතික මට්ටමේ තරඟාවලියක පර්යේෂණ ඇගයීම් ලබා තිබීම | 04 |
| පළාත්/ දිස්ත්‍රික් මට්ටමේ පර්යේෂණ ජයග්‍රහණ | 03 |

**උපරිම ලකුණු 08**

CS CamScanner

වගු අංක 09: විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා

| ලබා ඇති පදක්කම | ලකුණු |
|---|---|
| ජනාධිපති බාලදක්ෂ/ බාලදක්ෂිකා පදක්කම/ බලලත් නිලධාරි 1/ පරිසර නියමු ජනාධිපති පදක්කම/ ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තුව අගමැති/කථානායක/ අමාත්‍ය | 05 |
| අග්‍රාමාත්‍ය ප්‍රදානය/ පළමු පෙළ පදක්කම/ අන්තර් ජාතික කඳවුරු/වැඩසටහන් සහභාගීත්වය/ බලලත් නිලධාරි 2/ මාණ්ඩලික සැරයන්/සැරයන්/ ස්වර්ණ වර්ණ පදක්කම/ රජත පදක්කම/ ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තුව මන්ත්‍රී/ පළාත් ශිෂ්‍ය පාර්ලිමේන්තුව අගමැති/කථානායක/ අමාත්‍ය | 04 |
| ලාන්ස් කෝප්‍රල්/ පෙරදිග / අපරදිග තූර්ය වාදක කණ්ඩය / ගර්ටන් ලූස් / ද සොයිසා / ජ්‍යාන්තන්තර නියෝජන/ හරිත පදක්කම/ පළාත් ශිෂ්‍ය පාර්ලිමේන්තුව මන්ත්‍රී/ කථානායක/ කලාප ශිෂ්‍ය පාර්ලිමේන්තුව/ අගමැති /කථානායක | 03 |
| බාලදක්ෂ/බාලදක්ෂිකා/රේන්ජර් දක්ෂිකා සමාජිකත්වය/ කලාප ශිෂ්‍ය පාර්ලිමේන්තුව අමාත්‍ය/ මන්ත්‍රී | 02 |

**උපරිම ලකුණු 05**

**6.7 පොදු නිර්ණායක II කොටස**

**අ.පො.ස.(උ.පෙළ)ට ඇතුළත් වීමට අදාළ අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල**

**වගු අංක 10: අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල සඳහා ලකුණු ලබා දීම.**

| | |
|---|---|
| විෂයන් නවයටම A සාමාර්ථ සහිතව සා.පෙළ සමත්වීම | ලකුණු 6 |
| ඕනෑ ම විෂයන් 6ත් -8ත් අතර සංඛ්‍යාවක් සඳහා A සාමාර්ථ සහිතව සා.පෙළ සමත්වීම | ලකුණු 5 |
| ඕනෑ ම විෂයන් 4ත් -5ත් අතර සංඛ්‍යාවක් සඳහා A සාමාර්ථ සහිතව සා.පෙළ සමත්වීම | ලකුණු 4 |
| ඕනෑ ම විෂයන් 1ත් -3ත් අතර සංඛ්‍යාවක් සඳහා A සාමාර්ථ සහිතව සා.පෙළ සමත්වීම | ලකුණු 3 |
| සම්මාන සාමාර්ථ 3 ක් සහිත ව සා.පෙළ සමත්වීම | ලකුණු 2 |

**උපරිම ලකුණු 06**

**6.8 පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළව ක්‍රියාකාරකම් සහ ජයග්‍රහණ**

**වගු අංක 11: පර්යේෂණ සඳහා ලකුණු ලබා දීම**

| පර්යේෂණ අවස්ථා | ලකුණු |
|---|---|
| අන්තර්ජාතික මට්ටමින් පර්යේෂණ ඉදිරිපත් කිරීම | 08 |
| ජාතික මට්ටමින්පර්යේෂණක් ප්‍රසිද්ධ කිරීම, පිළිගත් ආයතනයකට/ විශ්ව විද්‍යාලයකට හෝ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබීම | 07 |
| පර්යේෂණක් ලිඛිත හා මුද්‍රිත මාධ්‍යය මගින් ප්‍රසිද්ධ කිරීම. | 06 |
| ජාතික මට්ටමේ තරඟාවලියක පර්යෙෂණ ජයග්‍රහණ | 05 |
| ජාතික මට්ටමේ තරඟාවලියක පර්යෙෂණ ඇගයීම් ලබා තිබීම | 04 |
| පළාත්/ දිස්ත්‍රික් මට්ටමේ පර්යේෂණ ජයග්‍රහණ | 03 |

**උපරිම ලකුණු 08**

CS CamScanner

**6.9 පාසලේ නායකත්ව දැරීම (උපරිම ලකුණු 03)**

වගු අංක 12: නායකත්ව සඳහා ලකුණු ලබා දීම

| නායකත්වය | ලකුණු |
|---|---|
| කණිෂ්ඨ/ ජ්‍යෙෂ්ඨ/ ප්‍රධාන ශිෂ්‍ය නායක / ක්‍රීඩා නායක | 03 |
| කණිෂ්ඨ/ ජ්‍යෙෂ්ඨ/උප ප්‍රධාන ශිෂ්‍ය නායක / ක්‍රීඩා උප නායක | 02 |
| ශිෂ්‍ය නායක | 01 |

උපරිම ලකුණු 03

**6.10 රාජ්‍ය /අර්ධ රාජ්‍ය/ පෞද්ගලික ආයතන / රාජ්‍ය හා පෞද්ගලික විශ්ව විද්‍යාල/ යුනෙස්කෝ/ යුනිසෙෆ් ආදී අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාශයේ විධිමත් අනුමැතිය ලද තරග/ වැඩසටහන් වෙනුවෙන් ලකුණු ලබා දීම (උපරිම ලකුණු 03)**

වගු අංක 13: ආයතන මගින් පවත්වනු ලබන තරග සඳහා ලකුණු ලබා දීම

| ලබාගත් ස්ථානය | ලකුණු |
|---|---|
| පළමු ස්ථානය | 03 |
| දෙවන ස්ථානය | 02 |
| තෙවන ස්ථානය | 01 |

උපරිම ලකුණු 03

**මුළු ලකුණු 100**

## 07. සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමේදී අවධානය යොමු කළ යුතු කරුණු

**7.1** ජාත්‍යන්තර තරග සඳහා ලකුණු ලබා දීමේදී පිළිගත් අන්තර්ජාතික හෝ කලාපීය සංවිධාන මගින් පවත්වන ලද තරග සලකා බැලිය යුතු ය.

**7.2** නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ සලකා බැලීමේදී අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාශය, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය, නව නිපැයුම් කරුවන්ගේ කොමිසම, ජාතික විද්‍යා පදනම හෝ රාජ්‍ය විශ්ව විද්‍යාල මගින් පවත්වන ලද තරගවලින් ලබා ගත් ජයග්‍රහණ පමණක් සලකා බැලිය යුතු ය.

**7.3** සෞන්දර්ය කාණ්ඩය යටතේ අයදුම් කර ඇති සිසුන් තෝරා ගැනීමේ දී අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය ශාඛාව මගින් මෙහෙයවන ලද සමස්ත ලංකා සෞන්දර්ය තරග අදාළ කර ගත යුතු ය. නාට්‍ය තරග සඳහා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාශය ,සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,ටවර් හෝල් පදනම ආදී ආයතන මෙහෙයවනු ලබන රාජ්‍ය ළමා නාට්‍ය උළෙල,සමස්ත ලංකා පාසල් නාට්‍ය තරගය, සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙල යන තරගවල හොඳම නළුවා/නිළිය, හොඳම සහාය නළුවා/ සහාය නිළිය, හොඳම භූමිකා රංගනය ඉදිරිපත් කළ ශිෂ්‍යයා/ශිෂ්‍යයාව පළමු, දෙවන හා තෙවන ස්ථානය පමණක් සලකා බැලිය යුතු ය.

**7.4** ක්‍රීඩා කාණ්ඩය යටතේ අයදුම් කර ඇති සිසුන් තෝරා ගැනීමේ දී අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රීඩා ශාඛාව,පාසල් ක්‍රීඩා සංගම්, ජාතික ක්‍රීඩා සංගම්,ක්‍රීඩා අමාත්‍යාංශය මගින් පවත්වන ලද තරගවලින් ලබා ගත් ජයග්‍රහණ පමණක් සලකා බැලිය යුතු ය.

CamScanner

## 08. ශිෂ්‍යත්ව ප්‍රදානය

**8.1** ද්විතියික අධ්‍යාපන අවධියේ සුවිශේෂ දක්ෂතා ප්‍රදර්ශනය කළ හා අදාළ වර්ෂයේ 12 වන ශ්‍රේණියට ඇතුළත් ව අ.පො.ස.(උසස් පෙළ) අධ්‍යාපනය ආරම්භ කරන සිසුන් අතරින් තෝරා ගත් සිසුන්ට අ.පො.ස. (උ.පෙළ) ඉගෙනුම ලබන අවුරුදු 2ක කාල සීමාව වෙනුවෙන් එක් මාසයකට රු.2500/= බැගින් ශිෂ්‍යත්ව වාරික 20ක් සඳහා ලබා දෙනු ලැබේ. එම වාරික 20 හි වටිනාකම වන රු. 50,000ක සමස්ත ශිෂ්‍යත්ව මුදල රු 25,000 බැගින් වාර දෙකක දී ශිෂ්‍යත්වලාභියාගේ නමට විවෘත කරනු ලබන ලංකා බැංකුවේ හෝ මහජන බැංකුවේ බැංකු ගිණුමකට කලාප අධ්‍යාපන කාර්යාලය විසින් ඍජුව ම ප්‍රේෂණය කළ යුතුය.

**8.2** එමෙන්ම පළමුවර ශිෂ්‍යත්ව මුදල් ගිණුම්ගත කිරීමෙන් පසු ශිෂ්‍යත්වධාරියා අඛණ්ඩ අධ්‍යාපන කටයුතුවල නියැලීම පිළිබඳ පාසල් මගින් නියාමනය කිරීමෙන් පසු දෙවන වර ශිෂ්‍යත්ව මුදල් ගිණුම්ගත කිරීම සිදුකළ යුතුය.

**8.3** මෙම ශිෂ්‍යත්වලාභීන් අඛණ්ඩ ව අධීක්ෂණය කිරීම සඳහා අදාළ පාසල මඟින් සුදුසු ගුරුවරයෙකු පත් කළ යුතු අතර එම ගුරුභවතා ශිෂ්‍යත්වලාභියාට නිසි මඟපෙන්වීම සිදු කළ යුතු ය.

**8.4** පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් මෙම ශිෂ්‍යත්වය සඳහා තෝරා ගත් සිසු සිසුවියන්ගේ නම් අදාළ පාසල වෙත දැනුම් දුන් පසු විදුහල්පති විසින් මෙම ශිෂ්‍යත්වලාභීන් අදාළ විදුහලේ අඛණ්ඩව ඉගෙනුම ලබන බවට හා ශිෂ්‍යත්වය ලබා දීම යෝග්‍ය බව තහවුරු කෙරෙන ලිපියක් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂට ද පිටපතක් සහිත ව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලබා දීමට කටයුතු කළ යුතු වේ. ඉන් පසු ශිෂ්‍යත්ව ප්‍රදානය සිදු කරන අදාළ කාල සීමාව තුළ දී ද අදාළ ශිෂ්‍යත්වලාභියා එම පාසලේ අඛණ්ඩ ව අධ්‍යාපනය ලබන බවට ලිපියක් වාර්ෂිකව විදුහල්පති විසින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට පිටපතක් සහිතව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලබා දීමට කටයුතු කළ යුතු වේ.

**8.5** අදාළ ශිෂ්‍යත්වලාභියා යම් හේතුවක් නිසා ඉගෙනුම ලබන පාසලෙන් ඉවත් ව වෙනත් පාසලකට ඇතුළත් ව ඇත්නම්, ඒ බව තහවුරු කෙරෙන ලිපියක් විදුහල්පති විසින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට පිටපතක් සහිත ව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු ය.

## 09. ශිෂ්‍යත්ව නියාමනය

**9.1** කලාප මට්ටමින් ශිෂ්‍යත්වලාභීන් නියාමනය කිරීම ඔවුන් ඉගෙනුම ලබන පාසල අයත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදුකළ යුතුය. ඒ සඳහා සුභග ශිෂ්‍යත්ව සම්බන්ධීකරණ නිලධාරියාට අදාළ වගකීම පැවරිය යුතුය.

**9.2** පළාත් මට්ටමින් ශිෂ්‍යත්වලාභීන් නියාමනය කිරීම අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදුකළ යුතු අතර ඒ සම්බන්ධ වගකීම සුභග ශිෂ්‍යත්ව සම්බන්ධීකරණ නිලධාරියාට පැවරිය යුතුය.

**9.3** ජාතික මට්ටමින් ශිෂ්‍යත්වලාභීන් නියාමනය කිරීම අවශ්‍ය අවස්ථාවලදී අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාව මඟින් සිදු කරනු ඇත.

**9.4** සුභග ශිෂ්‍යත්ව වාරික ගෙවීමෙන් පසු එහි ප්‍රගතිය ඇතුළත් වාර්තාවක් ඇමුණුම් අංක (05) මගින් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාශ ලේකම් වෙත පළාත් මට්ටමෙන් ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

CamScanner

## 10. ශිෂ්‍යත්වය අවලංගු විය හැකි අවස්ථා

පහත සඳහන් අවස්ථා හා හේතු පිළිබඳ සලකා බලා චක්‍රලේඛ අනුව සුහග ශිෂ්‍යත්වලාභීන්ට ලබාදෙන ශිෂ්‍යත්ව අවලංගු කිරීමේ බලය අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාශ ලේකම් සතු වේ.

I. ශිෂ්‍යත්වලාභියා විනය විරෝධී හැසිරීම සඳහා දඬුවම් ලැබීම.
II. අඛණ්ඩ ව පාසලට නොපැමිණීම.
III. අඛණ්ඩ අධ්‍යාපන කටයුතුවලින් බැහැර වීම.
IV. අ.පො.ස.(උ.පෙළ) අධ්‍යාපනය සම්පූර්ණ නොකර පාසලෙන් ඉවත් වීම.

මෙම චක්‍රලේඛයේ කිසියම් ගැටලුවක් ඇත්නම් ඒ සම්බන්ධයෙන් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත. මෙම චක්‍රලේඛයට අදාළ ව දෙමළ පිටපතෙහි මතු වන ගැටළු සහිත අවස්ථාවල දී අපැහැදිලි කරුණක් සම්බන්ධයෙන් සිංහල පිටපතෙහි උපදෙස් අනුගමනය කළ යුතු ය.

නාලක කළුවැව
ලේකම්
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත - විගණකාධිපති - විගණකාධිපති දෙපාර්තමේන්තුව

CamScanner

ඇමුණුම 02 (A)

**සුහග ශිෂ්‍යත්ව වැඩසටහන .........**

**තෝරා ගත් ශිෂ්‍ය නාම ලේඛනය - පාසල් මට්ටම**

1. පාසලේ තොරතුරු
   1.1. පාසල: ............................................................
   1.2. පාසලේ ලිපිනය: ............................................................
   1.3. පාසලේ දුරකතන අංකය: ............................................................
   1.4. ජාතික / පළාත් පාසලක් යන බව : ............................................................
   1.5. කලාපය : ............................................................
   1.6. පළාත : ............................................................
2. කාණ්ඩය

( කාණ්ඩය දැක්වීම සඳහා අදාළ කොටුව තුළ√ ලකුණ යොදන්න)

| | |
|---|---|
| කාණ්ඩ අංකය 01 - නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ | |
| කාණ්ඩ අංකය 02 - සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ | |
| කාණ්ඩ අංකය 03 - ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ | |
| කාණ්ඩ අංකය 04 - විද්‍යා, ගණිත, භාෂා, තොරතුරු තාක්ෂණ ඇතුළු අනෙකුත් විෂයයන් සඳහා ලබා ගත් ජයග්‍රහණ | |
| කාණ්ඩ අංකය 05 - විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ | |

3. තෝරාගත් ශිෂ්‍ය තොරතුරු

| අනු අංකය | අයදුම්කරුගේ නම | පෞද්ගලික ලිපිනය | දුරකතන අංකය | ලබා ගත් ලකුණු | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | විශේෂ නිර්ණායක | පොදු නිර්ණායක I | පොදු නිර්ණායක II | මුළු ලකුණු |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

4. පාසලට ඉදිරිපත් වූ මුළු අයදුම්පත් සංඛ්‍යාව : ............................................................
5. කලාපයට ඉදිරිපත් කරන අයදුම්පත් සංඛ්‍යාව : ............................................................
6. තෝරාගත් අයදුම්පත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කිරීම

   පාසල වෙත ඉදිරිපත් වූ අයදුම්පත් පාසල් තේරීම් කමිටුව/ කමිටු විසින් පරීක්ෂා කරනු ලැබූ අතර සිසුන්ගේ සුදුසුකම් පරීක්ෂාකර චක්‍රලේඛ අනුව ලබාදුන් ලකුණු මෙහි ඇතුලත් කර ඇත. අයදුම්පත් .......................... ක් (අයදුම්පත් සංඛ්‍යාව දක්වන්න) කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කරමි.

විදුහල්පති අත්සන :

නිල මුද්‍රාව :

දිනය:

ඇමුණුම 02 (B)

## සුහඟ ශිෂ්‍යත්ව වැඩසටහන

## තෝරා ගත් ශිෂ්‍ය නාම ලේඛනය - කලාප මට්ටම

කලාපය : ....................................  පළාත : ....................................

1. කාණ්ඩය (ඉල්ලුම් කරන කාණ්ඩයට අදාළ කොටුව තුළ √ ලකුණ යොදන්න)

| | |
|---|---|
| කාණ්ඩ අංකය 01 - නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ | |
| කාණ්ඩ අංකය 02 - සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ | |
| කාණ්ඩ අංකය 03 - ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ | |
| කාණ්ඩ අංකය 04 - විද්‍යා, ගණිත, භාෂා, තොරතුරු තාක්ෂණ ඇතුළු අනෙකුත් විෂයයන් සඳහා ලබා ගත් ජයග්‍රහණ | |
| කාණ්ඩ අංකය 05 - විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ | |

2. තෝරා ගත් ශිෂ්‍ය/ ශිෂ්‍යාවන්ගේ තොරතුරු

| අනු අංකය | අයදුම්කරුගේ නම | පෞද්ගලික ලිපිනය | දුරකතන අංකය | ලබා ගත් ලකුණු | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | විශේෂ නිර්ණායක | පොදු නිර්ණායක I | පොදු නිර්ණායක II | මුළු ලකුණු |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

3. කලාපයට ඉදිරිපත් වූ මුළු අයදුම්පත් සංඛ්‍යාව : ..................................................
4. පළාතට ඉදිරිපත් කරන අයදුම්පත් සංඛ්‍යාව : ......................................................
5. තෝරා ගත් අයදුම්පත් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කිරීම

කලාප මට්ටමින් චක්‍රලේඛානුකූලව තෝරා ගත් අවසාන ශිෂ්‍ය නාම ලේඛනය මෙහි ඇතුළත් කර ඇත. ඉහත සඳහන් නාම ලේඛනය නිවැරදි බව සහතික කර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කරමි.

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන :  දිනය :

නිල මුද්‍රාව :

CS CamScanner

ඇමුණුම 03

1. ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ සම්පූර්ණ නම: ..............................................................................................................

2. ඉගෙනුම ලබන පාසල :..............................................................................................................

3. ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ ලංකා බැංකු/මහජන බැංකු ගිණුම් අංකය:.............................. ශාඛාවේ කේත අංකය:...............................
(ගිණුම් පොතෙහි බැංකු ශාඛාව,නම හා ගිණුම් අංකය සහිත පිටුවෙහි ඡායා පිටපතක් එවිය යුතුය.)

4. මව/පියා/භාරකරුගේ නම හා ලිපිනය ...................................................................

දුරකථන අංකය..............................................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ අත්සන දෙමව්පිය/භාරකරුගේ අත්සන

දිනය

විදුහල්පති නිර්දේශය

ඉහත නම සඳහන් ශිෂ්‍යයා/ශිෂ්‍යාව මෙම විද්‍යාලයේ 12වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන බවත් ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි. අදාළ ශිෂ්‍යයාගේ ගිණුම් පොතෙහි බැංකු ශාඛාව,නම හා ගිණුම් අංකය සහිත පිටුවෙහි සහතික කරන ලද ඡායා පිටපත් මේ සමඟ යොමු කරමි.

දිනය විදුහල්පති අත්සන හා නිල මුද්‍රාව

CamScanner

ඇමුණුම 04

**සුභග ශිෂ්‍යත්ව වැඩසටහන**

**තෝරා ගත් ශිෂ්‍ය නාම ලේඛනය - පළාත් මට්ටම**

පළාත : .............................

1. තෝරා ගත් ශිෂ්‍ය / ශිෂ්‍යාවන්ගේ තොරතුරු

| අනු අංක | කලාපය | කාණ්ඩය (01/02/03/04/05) | ශිෂ්‍යත්වලාභියාගේ නම | පාසල | පාසලේ ලිපිනය | පෞද්ගලික ලිපිනය | දුරකතන අංකය | ලබාගත් මුළු ලකුණු | බැංකු ගිණුම් අංකය | බැංකු ශාඛාවේ කේත අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

2. අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කරන අයදුම්පත් සංඛ්‍යාව : ............................................

3. තෝරාගත් අයදුම්පත අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කිරීම

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් වූ අයදුම්පත් පළාත් තේරීම් කමිටුව / කමිටු විසින් පරීක්ෂා කරනු ලැබූ අතර චක්‍රලේඛ උපදෙස් අනුව සුභග ශිෂ්‍යත්ව ලාභීන්ගේ තෝරාගත් නාම ලේඛනය මෙහි ඇතුළත් කර ඇත. ඉහත සඳහන් නාම ලේඛනය හා සිසුන්ගේ බැංකු ගිණුම් තොරතුරු නිවැරදි බව සහතික කරමි.

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන : දිනය :

නිල මුද්‍රාව :

CamScanner

ඇමුණුම 05

## සුහග ශිෂ්‍යත්ව වැඩසටහන

### ශිෂ්‍යත්ව වාරික ගෙවීමෙන් පසු ප්‍රගතිය සහ නියාමනය - පළාත් මට්ටම

පළාත : ...............................

1. ශිෂ්‍යාධාර මුදල ගෙවනු ලැබූ ශිෂ්‍ය / ශිෂ්‍යාවන්ගේ තොරතුරු

| අනු අංක | කලාපය | ශිෂ්‍යත්වලාභියාගේ නම | පාසල | පාසලේ ලිපිනය | පෞද්ගලික ලිපිනය | දුරකතන අංකය | බැංකු ගිණුම් අංකය | බැංකු ශාඛාවේ කේත අංකය | ගෙවූ මුදල | ගෙවන ලද දිනය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| මුළු මුදල | | | | | | | | | | | |

2. ගෙවීම් කර ඇති මුළු ශිෂ්‍ය සංඛ්‍යාව : ............................................
3. ගෙවීම් කර ඇති මුළු වටිනාකම : ............................................
4. එක් එක් වාරික ගෙවීමෙන් පසු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන වාර්තාව

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් වූ අයදුම්පත් පළාත් තේරීම් කමිටුව / කමිටු විසින් පරීක්ෂා කරනු ලැබූ අතර චක්‍රලේඛ උපදෙස් අනුව සුහග ශිෂ්‍යත්ව ලාභීන්ගේ තෝරාගත් නාම ලේඛනය මෙහි ඇතුළත් කර ඇත. ඉහත සඳහන් නාම ලේඛනය හා සිසුන්ගේ බැංකු ගිණුම් තොරතුරු නිවැරදි බව සහතික කරමි.

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන : 　　　　　　　　　　　　　 දිනය :

නිල මුද්‍රාව :

ඇමුණුම අංක **01**

| |
|---|
| |

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ
ප්‍රයෝජන සඳහා (උදා:WP/01/150)

අගල් 1.5 X 2

(පාස්පෝට් ප්‍රමාණයේ)

**සුහඟ ශිෂ්‍යත්ව - (2023 -2024 අධ්‍යයන වර්ෂය)**
**අයදුම්පත්‍රය**

පළාත:- [ ] කලාපය:- [ ]

පාසල:-..........................................................................................

**26/2025 චක්‍රලේඛයේ සඳහන් උපදෙස් අනුව ඉල්ලුම් කරන කාණ්ඩයට අදාළව නිවැරදි ව අයදුම්පත්‍රය සම්පූර්ණ කරන්න. කාණ්ඩ කිහිපයකින් ඉල්ලුම් කරන්නේ නම් එක් එක් කාණ්ඩය යටතේ වෙන් වෙන් වශයෙන් ඉල්ලුම් කළ යුතු ය. මෙහිදී එක් එක් කාණ්ඩය යටතේ අදාළ සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතික කළ පිටපත් අමුණා එවිය යුතු ය.**

**1. ඉල්ලුම් කරන කාණ්ඩ :-**

| | |
|---|---|
| **කාණ්ඩ අංක 01** | |
| කාණ්ඩ අංක 02 | |
| කාණ්ඩ අංක 03 | |
| කාණ්ඩ අංක 04 | |
| කාණ්ඩ අංක 05 | |

**2. ශිෂ්‍යයා/ශිෂ්‍යාව පිළිබඳ විස්තර :-**

2.1 ශිෂ්‍යයාගේ /ශිෂ්‍යාවගේ සම්පූර්ණ නම :-

.......................................................................................................

2.2 මුලකුරු සමඟ නම :-
(ඉංග්‍රීසි කැපිටල් අකුරින් ලියන්න.)

2.3 පෞද්ගලික ලිපිනය:-
(ඉංග්‍රීසි කැපිටල් අකුරින් ලියන්න.)

2.4 පෞද්ගලික දුරකථන අංකය :-

2.5 උපන් දිනය :- වර්ෂය මාසය දිනය

2.6 ස්ත්‍රී /පුරුෂ භාවය:-

| ස්ත්‍රී | | පුරුෂ | |
|---|---|---|---|

2.7 අ.පො.ස (සා.පෙළ) විභාගයට පෙනී සිටි පාසල:-
(ඉංග්‍රීසි කැපිටල් අකුරින් ලියන්න.)

2.8 අ.පො.ස(උ/පෙළ ) සඳහා වෙනත් පාසලකට ඇතුළත් වී ඇත්නම් එම පාසල:-
(ඉංග්‍රීසි කැපිටල් අකුරින් ලියන්න.)

3. පහත සඳහන් නිර්ණායකවලට අදාළ ව ශිෂ්‍ය/ශිෂ්‍යාවන් දක්වා ඇති දක්ෂතා සඳහන් කරන්න. මෙහි දී උපරිම දක්ෂතා පෙන්වන ලද/උපරිම ලකුණු ලැබිය හැකි අවස්ථා තුනක් පමණක් සඳහන් කරන්න.

**විශේෂ නිර්ණායක හා පොදු නිර්ණායක I කොටස**

| නිර්ණායක | ලකුණු (කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා) | | |
|---|---|---|---|
| | පාසල් මට්ටම | කලාප මට්ටම | පළාත් මට්ටම |
| | නිර් අංක 01 | නිර් අංක 02 | නිර් අංක 03 |

**3.1 නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ**

| නව නිපැයුම | පේටන්ට ලබා ඇත/නැත | ලබා තිබෙ නම වර්ෂය | ලබා ඇති ජයග්‍රහණය | | | | තරගය පවත්වන ලද ආයතනය |
|---|---|---|---|---|---|---|---|
| | | | අන්තර්ජාතික | ජාතික | පළාත් | කලාප | |
| | | | 1/2/3 | 1/2/3 /කුසලතා | 1/2/3 | 1 | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

**3.2 සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ**

| සෞන්දර්ය ක්‍රියාකාරකම/ තරගය | ඒකල/සමූහ | පවත්වන ලද වර්ෂය | ලබා ඇති ජයග්‍රහණය පළාත් | | | | තරගය පවත්වන ලද ආයතනය |
|---|---|---|---|---|---|---|---|
| | | | අන්තර් ජාතික | ජාතික | පළාත් | කලාප | |
| | | | 1/2/3 | 1/2/3 | 1/2/3 | 1 | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

**3.3 ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ**

| ක්‍රීඩා තරගය | කේවල/කණ්ඩායම | පවත්වන ලද වර්ෂය | ලබා ඇති ජයග්‍රහණය | | | | තරගය පවත්වන ලද ආයතනය |
|---|---|---|---|---|---|---|---|
| | | | අන්තර්ජාතික | ජාතික | පළාත් | කලාප | |
| | | | 1/2/3 | 1/2/3 | 1/2/3 | 1 | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

**3.4 විද්‍යා, ගණිත, භාෂා, තොරතුරු තාක්ෂණ ඇතුළු අනෙකුත් විෂයයන් සඳහා ලබා ගත් ජයග්‍රහණ**

| ක්‍රීඩා තරගය | කේවල/කණ්ඩායම | පවත්වන ලද වර්ෂය | ලබා ඇති ජයග්‍රහණය | | | | තරගය පවත්වන ලද ආයතනය |
|---|---|---|---|---|---|---|---|
| | | | අන්තර්ජාතික | ජාතික | පළාත් | කලාප | |
| | | | 1/2/3 | 1/2/3 | 1/2/3 | 1 | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

**3.5.විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ**

| විෂය සමගාමී ක්‍රියාකාරකම | පවත්වන ලද වර්ෂය | ලබා ඇති ඉහළම පදක්කම/ දරන ලද ඉහළම තනතුර |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

**පොදු නිර්ණායක II කොටස**

**3.6 අ.පො.ස (උ.පෙළ ට) ඇතුළත්වීමට අදාළ අ.පො.ස (සා.පෙළ) ප්‍රතිඵල**

i. අ.පො.ස) සා.පෙළ (විභාගයට පෙනී සිටි වර්ෂය-:

ii. අ.පො.ස.(සා.පෙළ) විභාග අංකය :-

iii. අ.පො.ස.(සා.පෙළ) විභාග ප්‍රතිඵල පහත වගුවේ සඳහන් කරන්න.

| අනු අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |
| 6 | | |
| 7 | | |
| 8 | | |
| 9 | | |

**3.7 පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළ ක්‍රියාකාරකම් සහ ජයග්‍රහණ**

| ක්‍රියාකාරකම | පවත්වන ලද වර්ෂය | ලබා ඇති ජයග්‍රහණය | | | තරගය / ක්‍රියාකාරකම පවත්වන ලද ආයතනය |
|---|---|---|---|---|---|
| | | අන්තර්ජාතික | ජාතික | පළාත් | |
| | | 1/2/3 | 1/2/3 | 1/2/3 | |
| | | | | | |
| | | | | | |

**3.8 පාසල් නායකත්වය දැරීම**

| නායකත්වය | වර්ෂය |
|---|---|
| කණිෂ්ඨ/ ජ්‍යෙෂ්ඨ/ ප්‍රධාන ශිෂ්‍ය නායක / ක්‍රීඩා නායක | |
| කණිෂ්ඨ/ ජ්‍යෙෂ්ඨ/උප ප්‍රධාන ශිෂ්‍ය නායක / ක්‍රීඩා උප නායක | |
| ශිෂ්‍ය නායක | |

**3.9 චක්‍රලේඛයේ 6.3.4 වගන්තිය යටතේ ලබා ඇති ජයග්‍රහණ**

| තරගය / ක්‍රියාකාරකම පවත්වන ලද ආයතනය | ලබා ඇති ස්ථානය |
|---|---|
| | |
| | |
| | |

මා විසින් ඉහත සහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සුහග ශිෂ්‍යත්වයක් ලබා ගැනීම සඳහා මා තෝරා ගත හොත් එම ශිෂ්‍යත්වයට අදාළ නීතිරීතිවලට එකඟ වන බවත්, ප්‍රකාශ කරමි. මා විසින් සඳහන් කරන ලද යම් තොරතුරක් අසත්‍ය බව/කූටබව හෙළි වුවහොත් මාගේ ශිෂ්‍යත්වය අහිමිවන බව මම දනිමි.

දිනය: ......................................

ශිෂ්‍යයාගේ/ශිෂ්‍යාවගේ අත්සන

---

**අ.පො.ස (සා. පෙළ) ඉගෙනුම ලැබූ පාසලේ විදුහල්පතිගේ සහතිකය**

..............................................................................................ශිෂ්‍යයා/ ශිෂ්‍යාව අ.පො.ස (සා.පෙළ) විභාගයට මෙම විද්‍යාලයෙන් පෙනී සිටි බවත්,ඔහු /ඇය යහපත් හැසිරීමකින් යුතු සිසුවෙක්/සිසුවියක් වන බවත් ඉහත දක්වා ඇති තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බවත්, සුහග ශිෂ්‍යත්වයක් ලබා දීම සඳහා සුදුසු බවත් නිර්දේශ කරමි.

පාසලේ දුරකථන අංකය:

දිනය: .............................................

විදුහල්පතිගේ අත්සන හා නිල මුද්‍රාව

---

**අ.පො.ස (උසස් පෙළ) ඉගෙනුම ලබන පාසලේ විදුහල්පතිගේ සහතිකය**

..............................................................................................ශිෂ්‍යයා/ ශිෂ්‍යාව ............. ශ්‍රේණියේ සිට මෙම පාසලේ ඉගෙනුම ලබන බවත්, අ.පො.ස (උසස් පෙළ) හැදෑරීම සඳහා..........................................................................................විද්‍යාලයෙන් මෙම පාසලට පැමිණි බවත්, ඔහු/ඇය යහපත් හැසිරීමකින් යුතු සිසුවෙක්/සිසුවියක් වන බවත් ඉහත දක්වා ඇති තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බවත්, සුහග ශිෂ්‍යත්වයක් ලබා දීම සඳහා සුදුසු බවත් නිර්දේශ කරමි.

පාසලේ දුරකථන අංකය:

දිනය: ................................................

විදුහල්පතිගේ අත්සන හා නිල මුද්‍රාව

## කාර්යාලයීය ප්‍රයෝජන සඳහා

අයදුම්කරුවන් එක් එක් නිර්ණායක අනුව ලබා ගනු ලබන ලකුණු පහත වගුවේ සඳහන් කරන්න.

**ඉල්ලුම් කරන කාණ්ඩය:**

| | |
|---|---|
| **කාණ්ඩඅංක 01** | |
| කාණ්ඩඅංක 02 | |
| කාණ්ඩඅංක 03 | |
| කාණ්ඩඅංක 04 | |
| කාණ්ඩඅංක 05 | |

| | නිර්ණායකය | ලබා දිය යුතු ලකුණු | ලබා ගත් ලකුණු | | |
|---|---|---|---|---|---|
| | | | පාසල් මට්ටම | කලාප මට්ටම | පළාත් මට්ටම |
| විශේෂ නිර්ණායක | i. නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ | 60 | | | |
| | ii. සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ | | | | |
| | iii. ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ | | | | |
| | iv. විද්‍යා, ගණිත, භාෂා, තොරතුරු තාක්ෂණ ඇතුළු අනෙකුත් විෂයයන් සඳහා ලබා ගත් ජයග්‍රහණ | | | | |
| | v. විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ | | | | |
| පොදු නිර්ණායක I | i. නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ | 20 | | | |
| | ii. සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ | | | | |
| | iii. ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ | | | | |
| | iv. විද්‍යා, ගණිත, භාෂා, තොරතුරු තාක්ෂණ ඇතුළු අනෙකුත් විෂයයන් සඳහා ලබා ගත් ජයග්‍රහණ | | | | |
| | v. විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ | | | | |
| පොදු නිර්ණායක II | i. අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල මත ලකුණු | 06 | | | |
| | ii. පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළව ක්‍රියාකාරකම් සහ ජයග්‍රහණ | 08 | | | |
| | iii. පාසල් නායකත්වය දැරීම | 03 | | | |
| | iv. රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පෞද්ගලික ආයතන රාජ්‍ය හා පෞද්ගලික විශ්ව විද්‍යාල, යුනෙස්කො, යුනිසෙෆ් ආදී අධ්‍යාපන අමාත්‍යාංශයේ විධිමත් අනුමැතිය ලද තරඟ/ වැඩසටහන් | 03 | | | |
| මුළු ලකුණු | | 100 | | | |

පාසල් තේරීම් කමිටු: නිර්දේශය — ඉහත ලකුණු නිරවද්‍ය බව සහතික කරමි — 1...................... 2...................... 3......................

කලාප තේරීම් කමිටු : නිර්දේශය: — ඉහත ලකුණු නිරවද්‍ය බව සහතික කරමි — 1...................... 2...................... 3......................

පළාත් තේරීම් කමිටු: නිර්දේශය: — ඉහත ලකුණු නිරවද්‍ය බව සහතික කරමි — 1...................... 2...................... 3......................